


# ආඩම්බර හා පැංචා

ෂනුදි ඔමායා විජේකෝන්

# ආඩම්බර හා පැංචා.

කතෘ -ෂනුදි ඔමායා විජේකෝන්

# පිදුම

වසර දෙකක කාලයක්

මාහට අකුරු කරන්නට

සෙවණ දුන්

ආදරණීය මහමායා බාලිකා විදුහල්

මැණියන්ට

සෙනෙහසින් පුදන්නෙමි.......

පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමයි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්,දෙමාපියන්,ආදි ශිෂ්‍යාවන් හා සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්.ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාරකළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිණිය,
මහාමායා බාලිකා විදුහල-මහනුවර.
2023.10.20



කැළෑ ගමේ හිටියා
හරිම ආඩම්බර
ලස්සන
හා පැංචෙක්.

එයා කාටවත්ම කතා කරේ නෑ. කාටවත් කැමතිත් නෑ. ඒක හින්දා යාළුවෝ කවුරුත් හිටියෙත් නෑ.



කැළෑ ගමේ ඉන්න අනික් යාළුවෝ එයාට කතා කළත් එයා අහක බලාගෙන යනවා. හිනා වෙන්නෙත් නෑ.



දවසක් හා පැංචා කැළෑවේ තනියම කෑම හොයන්න ගියා. අතරමඟදී එයා ලොකු වලකට වැටුණා.

“අනේ කවුරු හරි මට උඩට එන්න උදව් කරන්නකෝ.........” හා පැංචා කෑ ගැහුවා. ඒත් එයාගේ උදව්වට කවුරුත් ආවේ නෑ.

ඒ වෙලාවේ එතනින් ගිය වලස් පැංචාට කවුදෝ අඬනවා ඇහුණා.
"කවුද මේ අඬන්නේ..." වලස් පැංචා තනියම කල්පනා කරා.



එයා හෙමින් හෙමින් අඬන්නේ කවුද
කියලා බලන්න ගියා..
“ අනේ මේ අපේ හා පැංචානේ...”
වලස් පැංචාට කියවුණා.





වලස් පැංචාට හරිම දුකයි. එයා හැම තැනම ඇවිදලා දිග කෝටුවක් හොයා ගත්තා.

“ හා පැංචෝ ඔය කෝටුව අල්ලාගෙන උඩට එන්න.. ”

වලස් පැංචා කීවා.

හා පැංචා කෝ්ටුව අල්ලා ගෙන හෙමීට උඩට ආවා.

ඊට පස්සේ එයා ලැජ්ජාවට බිම බලා ගෙනම හිටියා.





වලස් පැංචා හා පැංචා ළගට ආවා.

"අනේ යාළුවේ මට උදව් කරාට


ගොඩක් ස්තූතියි !

ඔයා හරිම හොඳයි...." හා පැංචා කීවා.

ආයේ කවදාවත් හා පැංචා ආඩම්බර වුණේ නෑ.හැමෝම එක්ක සතුටින් සමඟියෙන් හිටියා.



හා පැංචා වගේ පුංචි අපිත් ආඩම්බර නොවී හැමෝම එක්ක සතුටින් සමඟියෙන් ඉන්න ඕනේ...



පසුවදන

නූතන කාත්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නට මහාමායා පුංචි ගත්කතුවරියන් පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම්, නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමණයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ.

2023.10.20

# ස්තූතිය

මාව පුංචි කතුවරියක් කළ මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත්, ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමිය හා පංතිභාර ගුරුතුමිය වන ප්‍රමිතා වෙත්තසිංහ ගුරුමැණියන්ටත්, අනෙකුත් ගුරු මැණිවරුන්ටත්,ගුරු පියවරුන්ටත්, ආදරණීය අම්මා, අප්පච්චි,අත්තා හා අත්තම්මාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි.

